# ඇති සම්පත් යොදා
# වැඩි සම්පත් ලබා

වැවට වතුර පිරුනට පසු
බිම්හීයට සැරසෙන වද?
අක්වැස්සට සී සාගෙන
කන්නට වැඩ අරඹනවද?

හරක්බාන කුඹුරට දා
කෙවිටක් සොයමින් යනවද?
කන්නට පෙර සූදනම
මේ කන්නෙත් මගහරිද?

සිංහල නගුලෙන් සීසා
කුඹුරේ ඉරි අදින වාද?
හැඩ නගුලෙන් හීය හාලා
වල්ටික කුණු කරනවාද?

කන්න තුනක් පරන වියක්
මේ කන්නෙත් යොදනවාද?
ඒ වී ටික විකුණාගෙන
අළුත් වියක් වපුරනවද?

හරියට නොතෙමුන වී ටික
ගෝනිය තුළ පැල කරමුද?
නියමිත ලෙස පෙහවූ වී
යහනාක පැල කර බලමුද?

වැඩියෙන් යූරියා යොදමින්
කොලසායම ගානවාද?
සමබර පොහොරක් දීමෙන්
අස්වනු ටික වැඩි කරමුද?

ගොයමෙහි ඇති වල් පැල ටික
නෙලා නොගෙන වල් කපමුද?
වල් නෙලලා අස්වනු අපෙ
විසි ගුණයක් වැඩිකරමුද?

පැහී කරවී කරල් කැඩී
වී ටික බිම හලනවාද?
නියමිත දින ගනන් බලා
අස්වනු රැස් කරනවාද?

මහවැස්සත් – වැව්ජලයත්
එක කුඹුරට හරවනවද?
වැවේ වතුර ඉතිරි කරන්
යලක් ගැනත් සිතනවාද?

කොල පාගා වී විකුණා
වැඩි වියදම් කරනවාද?
අරපිරි මැස්මෙන් වැඩ කර
යමක් ඉතිරි කරනවාද?

ඩබ්. ඇම්. පියදාස
විෂය භාර නිලධාරි "වී"
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,
අනුරාධපුර,